# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,464 - 2025 නොවැම්බර් මස 21 වැනි සිකුරාදා - 2025.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් . . . . . . | — |
| පනත් කෙටුම්පත් . . . . . . | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් . . . . . . | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් . . . . . . | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන . . . . . . | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් . . . . . . | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් . . . . . . | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් . . . . . . | — |
| පිස්කල් විකිණීම් . . . . . . | 414 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් . . . . . . | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් . . . . . . | — |
| නොතාරිස් ලැයිස්තුව . . . . . . | — |
| විවිධ දැන්වීම් . . . . . . | 419 |



**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මාසයකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 දෙසැම්බර් මස 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 නොවැම්බර් මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.* )

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම

**බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

සණස ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්,
සීමාසහිත සණස සංවර්ධන බැංකුව යන නාමයෙන් ද හැඳින්වේ.
අංක 12, එඩ්මන්ටන් පාර,
කිරුළපන, කොළඹ 06.

නඩු අංකය : HC/CIVIL/280/2011/MR
කොළඹ වාණිජ මහාධිකරණ
ඇස්කිසි අංකය : 49/2024

*...........පැමිණිලිකරු.*

*එදිරිව*

1. පැස්කුවල් හැන්දි නයනානන්ද ද සිල්වා,
2. සූරිය ආරච්චිගේ ස්වර්ණලතා

*දෙදෙනාම :*

අක 287/5/1,
වැව පාර, මාලඹේ.

*.............විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ ඇතුළත් කර ඇති 2019.02.22 දිනැති තීන්දු ප්‍රකාශය ප්‍රකාර 1 සහ 2 විත්තිකරුවන්ගෙන් පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි රුපියල් හතලිස් තුන් ලක්ෂ පනස් නව දහස් හාරසිය විසි හතයි ශත හැත්තෑ හයක (රු. 4,359,427.76) මුදලක් හා රුපියල් තිස් අට ලක්ෂ හැත්තෑ නව දහස් පන්සිය පනස් එකයි ශත දහයක (රු. 3,879,551.10) ක් හා ඒ මත වර්ෂ 2011.04.06 දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා වර්ෂයකට 24% බැගින් පොළිය සහ මෙම ණය මුදලට අදාළ අනෙකුත් වියදම් සහ ගාස්තු අයකර ගැනීමට ආඥා කොට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින්,

එකී තීන්දුව ඉටු කිරීමට විත්තිකරුවන් විසින් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණ නඩු අංක HC/CIVIL/280/11/MR දරන නඩුව යටතේ නිකුත් කර ඇති ඇස්කීසිය ප්‍රකාරව, කොළඹ වාණිජ මහාධිකරණයේ ප්‍රධාන රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් පී. ඒ. ඩී. යූ. නන්දන වන මා විසින් වර්ෂ 2024 ක් වූ දෙසැම්බර් මස 10 දින නිසිලෙස තහනම් කරන ලද විත්තිකරුවන්ට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2025 ක් වූ දෙසැම්බර් මස 19 දින ප. ව. 2.00 ට,**

එකී නිශ්චල දේපළ පිහිටා ඇති ස්ථානයේ දී, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද,
2 සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ අයකිරීම් ද,

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි 75% ක මුදල දින 30ක් ඇතුළත කොළඹ, වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ, හේවාගම ගමෙහි පිහිටි "බටලන්ද" නැමති ඉඩමට වර්ෂ 1995ක් වූ මැයි මස 23 දිනැති බලයලත් මානක එල්. ජේ. ලියනගේ විසින් මැන සාදන ලද පිඹුරු අංක 6973 හි ලොට් අංක 3 සඳහා මායිම් : උතුරට : ලොට් 3 ද, නැගෙනහිරට : ලොට් 4 ද, දකුණට : සුසාන භූමිය ද, බස්නාහිරට : ලොට් 2 ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විසි එකක් (පර්. 21) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ ගොඩනැගිලි සහ සැම සියලු දේත් වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ P 1014/267 හි ලියාපදිංචි වී ඇත.

ඉහත ඉඩම මෑතක දී කරන ලද මැනුමකට අනුව පහත පරිදි වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ, හේවාගම ගමෙහි පිහිටි "බටලන්ද" නැමති ඉඩමට වර්ෂ 2007ක් වූ ජූලි මස 03 දිනැති බලයලත් මානක කේ. පී. පී. පියසේන ලියනගේ විසින් මැන සාදන ලද පිඹුරු අංක 1609 හි ලොට් අංක 3 සඳහා මායිම් : උතුරට : පිඹුරු අංක 6973 හි ලොට් 5 ද, නැගෙනහිරට : පිඹුරු අංක 6973 හි ලොට් 4 ද, දකුණට : සුසාන භූමිය ද, බස්නාහිරට : පිඹුරු අංක 6973 හි ලොට් 2 ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විසි එකක් (පර්. 21) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, ගොඩනැගිලි සහ සැම සියලු දේත් වේ.

ඉහත ඉඩම සඳහා ඇති මාර්ග අයිතිය ද පහත පරිදි වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ, හේවාගම ගමෙහි පිහිටි "බටලන්ද" නැමති ඉඩමට වර්ෂ 1995 ක් වූ මැයි මස 23 දිනැති බලයලත් මානක එල්. ජේ. ලියනගේ විසින් මැන සාදන ලද පිඹුරු අංක 6973 හි ලොට් අංක 5 සඳහා මායිම් : උතුරට : ජානක පණ්ඩිතරත්න හා තවත් අයට අයත් පිඹුරු අංක 1063 හි ලොට්1, 38, 39, 40 සහ 41 මාර්ගය ද, නැගෙනහිරට : ලොට් 4 ද, දකුණට : ලොට් 4 සහ 3 ද, බස්නාහිරට : ලොට් 2 සහ 1 ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හයක් (පර්. 6) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, ගොඩනැගිලි සහ සැම සියලු දේත් වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ P 1014/254 හි ලියාපදිංචි වී ඇත.

*දේපළට පිවිසීම* :-බත්තරමුල්ල සිට කඩුවෙල මාර්ගයේ කොතලාවල දක්වා ගමන් කර වම් පසට හමුවන විහාර මාවතට පිවිසී මීටර් 700 ක් පමණ ඉදිරියට යන විට හමුවන T හන්දියෙන් වම් පසට හැරී මීටර් 100ක් පමණ ගමන් කර නැවතත් වම් පසට හැරී (සොහොනට පෙර) මීටර් 100ක් පමණ ඉදිරියට යන විට හමුවන T හන්දියෙන් වම් පසට හැරී මීටර් 100ක් පමණ යන විට අදාළ දේපළ හමුවේ. (සාන්ස් බේකරිය).

ප්‍රධාන රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

වර්ෂ 2025ක් වූ නොවැම්බර් මස 13 දින දී ය.

11-291

---

**ගම්පහ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085, කොළඹ 02 සහ අංක 27, රණතුංග පාර,
ගම්පහ.

............*පැමිණිලිකරු.*

*එදිරිව*

මාවතගේ ඇන්ටනි අතුල,
අංක 171/1,
හලුගම, මීරිගම.

.............*විත්තිකරු.*

නඩු අංකය : 142/MB
ස්වභාවය : උකස්
ක්‍රියාපටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. 335,733.55
ඇස්කිසි අංකය : 412

142/MB නඩුවේ විත්තිකරුගෙන් වර්ෂ 2013ක් වූ ජූලි මස 19 දින දරන මෙම අධිකරණයේ සමථ වන ලද තීන්දු ප්‍රකාශය අනුව ඉහත කී විත්තිකරු කටයුතු නොකිරීම හේතුවෙන් වර්ෂ 2012.01.31 දින වන විට විත්තිකරු විසින් ගෙවිය යුතුව ඇති මූලික ණය ශේෂය වන රුපියල් එක් ලක්ෂ හතලිස්දහස් හත්සිය එකයි ශත අසූතුන ක (රු. 140,701.83) ක් සහ 2012.02.01 දින සිට එකී රුපියල් එක් ලක්ෂ හතලිස්දහස් හත්සිය එකයි ශත අසූතුන ක (රු. 140,701.83) මුදල මත වාර්ෂිකව 17.5% ක් වූ පොළියක් ද, එකී දින සිටම විත්තිකරු විසින් නිසි පරිදි වාරික නොගෙවීම මත එකතු වී ඇති හිඟ වාරික මුදල වන රුපියල් එක් ලක්ෂ දොළොස්දහස් තුන්සිය තිස්පහයි ශත විසි හත (රු. 112,335.27) ක මුදලක් ද, 2012.01.31 දිනට එකී හිඟ වාරික මුදල් සඳහා එකතු වී ඇති 2% බැගින් වූ අමතර පොළිය වන රුපියල් පනස් දෙදහස් දෙසිය අසූපහයි ශත විසිපහ (රු. 52,285.25) ක මුදලක් ද, 2012.02.01 දින සිට එකී හිඟ වාරික මුදල් වන රුපියල් එක් ලක්ෂ දොළොස් දහස් තුන්සිය තිස්පහයි ශත විසිහත (රු. 112,335.27) ක මුදල සහ ඉදිරියට නොගෙවා පැහැර හරිනු ලබන වාරික මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන් වනතුරු එකී මුදල මත වාර්ෂිකව 2% බැගින් වූ අමතර පොළියක් ද, අයකර ගැනීමේ කටයුතු වෙනුවෙන් දරන ලද මුදලවන රුපියල් තිස්දහස් හාරසිය එකොළහයි ශත විස්සක (රු. 30,411.20) මුදලක් ද, තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට සම්පූර්ණ මුදලම අයකර ගන්නා දිනය තෙක් එකී මුදල මත නෛතික පොළිය ද, නඩු ගාස්තු ද, ඇස්කිසි ගාස්තු සහ වෙන්දේසි ගාස්තු ද ඉහත කී විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ සම්බන්ධයෙන් ඔවුන්ට අයත් සියලු අයිතිවාසිකම් හා හිමිකම්,

**වර්ෂ 2025 ක් වූ දෙසැම්බර් මස 19 දින එම දේපළ පිහිටි ස්ථානයේ දී ප. ව. 2.00** ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*ප්‍රවේශ මාර්ගය.*-මීරිගම නගරයේ සිට දංඕවිට පාර ඔස්සේ හළුගම හංදිය දක්වා කිලෝමීටර් 02ක් පමණ දුරක් ගියවිට (කිලෝමීටර් 06 කණුවට මීටර් 20 ක් පමණ පෙර) අදාළ දේපළ දකුණු පසට වන්නට පිහිටා ඇත.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභා සීමාවට අයත් අංක 16A දරන හළුගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හළුගම ග්‍රාමයේ පිහිටි "ගොඩවත්ත" නැමැති ඉඩමට 1996.12.01 දින ජේ. එම්. ඩී. ටී. පී. රෙජිනෝල්ඩ් මානක තැන විසින් මැන සම්පාදිත අංක 25696 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 2 දරන ඉඩම් කොටසට මායිම් : උතුරට : කැබලි අංක 1 ද, නැගෙනහිරට : මීරිගම සිට හළුගම දක්වා වූ මහපාර ද, දකුණට : කැබලි අංක 1 ද සහ බස්නාහිරට : කැබලි අංක 1 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම හයක් (පර්. 10.6) හෙක්ටයාර් 0.0268 වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පලතුරු ආදී සියලු දේ ද, මාර්ග පරවශතාවයන් ද සමග අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 258/14 හි ලියාපදිංචි කර ඇත.

අධිකරණයේ අණ පරිදි,

රෙජිස්ට්‍රාර්/පිස්කල්,
දිසා අධිකරණය,
අත්තනගල්ල.

11-333

---

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

එලායන්ස් ෆිනෑන්ස් කම්පැණි පීඑල්සී,
අංක 84, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

නඩු අංකය : DMB 03/20
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 46,75,210.76
ඇස්කිසි අංකය : 29/2025

*...........පැමිණිලිකරු.*

*එදිරිව*

තුඩුසේන අප්පුහාමිලාගේ සුශාන් තරංග කුලරත්න,
අංක 81, පට්ටියාගම,
පූගොඩ.

*.............විත්තිකරු.*

කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ 2024 ක්වූ ඔක්තෝබර් මස 29 දිනැති ඒක පාර්ශ්වික තීන්දු ප්‍රකාශය ප්‍රකාරව අප ආයතනය වෙත ගෙවිය යුතු රුපියල් හතළිස් හය ලක්ෂ හැත්තෑ පන් දහස් දෙසිය දහයයි ශත හැත්තෑ හයක (රු. 4,675,210.76/-) මුදලින් කිසිදු මුදලක් ගෙවා නොමැති බැවින්, ඒ අනුව එකී ඉතිරි මුදල අයකර ගැනීම සඳහා පහත උපලේඛනයේ සඳහන් දේපළට ඇස්කිසි ක්‍රියාත්මක කිරීමට පැමිණිල්ලට අවසර දී ඇති බවට තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට මා විසින් 2025ක් වූ සැප්තැම්බර් මස 23 දින තහනමට ගෙන ඇති ඉහත නම සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2025 ක් වූ දෙසැම්බර් මස 12 දින ප. ව. 1.00 ට,**

ඉහත නම් සඳහන් විත්තිකරුගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ ගහබඩ පත්තුවේ පූගොඩ ප්‍රාදේශීය සභා සහ දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පට්ටියගම - 421 ග්‍රාම නිලධාරි වසම තුළ පට්ටියගම ගම පිහිටි "සියඹලාගහවත්ත, හිග්ගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. එස්. අලහකෝන් විසින් මැන සාදන ලද අංක 3915 සහ 2004.09.10 දින දරන පිඹුර ප්‍රකාර ලොට් A සඳහා මායිම් : උතුරට : යූ. ඩී. ඊ. කරුණානායක හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : ජී. ප්‍රනාන්දු සහ තවත් අය විසින් හිමිකම් කියන ළිඳමුල කුඹුර ද, දකුණට : ඩබ්ලිව්. එස්. එච්. වික්‍රමසිංහ හිමිකම් කියන ඉඩම ද, බටහිරට : එච්. ඒ. රංජිත් සහ තවත් අය හිමිකම් කියන ඉඩම ද යන මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් පහයි දශම හයයි හයක (අ. 1, පර්. 5.66) විශාලත්වය ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේ ද වේ. (මෙය අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 133/46 හි ලියාපදිංචි කර ඇත.)

*මාර්ග පරවශතා අයිතිය :*

පට්ටියගම ගම පිහිටි "සියඹලාගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඒ. ආනන්ද චන්ද්‍රසිරි විසින් මැන සාදන ලද අංක 253 සහ 2007.07.26 දින දරන පිඹුර ප්‍රකාර ලොට් A2 (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කරන ලද) සඳහා මායිම් : උතුරට : බී. එස්. අලහකෝන් මැන සාදන ලද පිඹුරු අංක 3915 හි ලොට් A ද, නැගෙනහිරට : ඩබ්ලිව්. එස්. එච්. වික්‍රමසිංහ හිමිකම් කියන කුඹුර ද, දකුණට : පාර සහ දයාවතී හිමිකම් කියන ඉඩම ද, බටහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ද යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම නවයයි හයක (පර්. 8.96) විශාලත්වය ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ. (මෙය අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 133/47 හි ලියාපදිංචි කර ඇත.)

*ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැනුම්කරු විසින් මා වෙත ගෙවිය යුතුය.
සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

01. සම්පූර්ණ ගැණුම් මුදලින් 25% එම ස්ථානයේ දී ම ගෙවිය යුතුය.
02. ඉතිරි 75% ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළව අධිකරණයේ තැන්පත් කළ යුතුය.
03. රජයේ ගාස්තු සහ අනෙකුත් ගාස්තු ගෙවිය යුතුය.

ඩබ්. ඒ. හේමමාලි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
පූගොඩ.

2025 නොවැම්බර් මස 04 වැනි දින.

11-311

**මහනුවර දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

මුණවීර ආරච්චිලාගේ මදූකා සෙනවිරත්න,
අංක 30, අමරගිරි, හියාරාපිටිය, හන්දෙස්ස.

*නඩු අංකය* : DMS 32/21
*කාර්ය පටිපාටිය* : ලඝු
*වටිනාකම* : රු. 1,250,000/-

*...........පැමිණිලිකාරිය.*

*එදිරිව*

ජයමිණි අරෝෂාන් ගුණසිංහ,
අංක 52/බී, අලපලාවල, හන්දෙස්ස.

*.............විත්තිකරු.*

විත්තිකරුගේ ඇස්තීසිය ක්‍රියාත්මක කරන ලද වර්තමාන ලිපිනය :

ජයමිණි අරෝෂාන් ගුණසිංහ,
අංක 52/බී, අලපලාවල, හන්දෙස්ස.

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2024 ක් වූ ජූනි මස 07 දින නඩු තීන්දුව ප්‍රකාරව ඉහත විත්තිකරු විසින් පැමිණිලිකාරියට රුපියල් දොළොස් ලක්ෂ පනස් දහසක (1,250,000/-) මුදලක් අයකර ගැනීමට නියෝග කර ඇති හෙයින්,

එකී තීන්දුව ප්‍රකාරව සිවිල් නඩු විධාන සංග්‍රහ පනතේ 237(1) වගන්තිය ප්‍රකාරව වර්ෂ 2025.05.28 දින මහනුවර දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් මගින් තහනමට ගනු ලැබූ පහත උපලේඛනයේ සඳහන් චංචල දේපළෙහි සියලුම අයිතිවාසිකම් හා හිමිකම්,

**වර්ෂ 2025ක් වූ දෙසැම්බර් මස 18 දින ප. ව. 1.30 ට,**

එම දේපළ පිහිටි අංක 52/බී, අලපලාවල, හන්දෙස්ස දරන ස්ථානයේ දී ප්‍රසිද්ධ පිස්කල් වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බවට ඔබ සැමට මෙයින් දැනුම් දෙමි.

ඉහත වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරුවන අතර, වෙන්දේසිය වෙනස් වූ වහාම ගැනුම්කරු විසින් මුළු ගැනුම් මිලෙන් 25% ක මුදලක් ද, රජයට අයවිය යුතු ගාස්තු ද, එකවරම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැනුම් මිලෙන් 75% ක ඉතිරි මුදල වෙන්දේසියේ දින සිට දින 30ක් ඇතුළත මහනුවර දිසා අධිකරණයේ ඇස්තීසි අංක 23/25 යටතේ සහ මහනුවර දිසා අධිකරණයේ නඩු අංක DMS 32/21 දරන නඩුවේ බැරට මහනුවර දිසා අධිකරණයේ තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

01. අභල් 32 LG වර්ණ රූපවාහිණී 01
02. 3 x 2 දැවමය ලී පෙට්ටගම් 01
03. වීදුරු සහිත ලී කෑම මේස 01 චේවැල් පුටු 04
04. 6 x 3 පියානෝ 01
05. චේවැල් හාන්සි පුටු 01
06. අඩි 2 1/2 පිත්තල මල් පෝච්චි 02
07. පිත්තල බුලත් තට්ටු 01
08. අඩි 1/2 මල් පෝච්චි පිත්තල 02
09. අඩි 1 1/2 උස පිත්තල පඩික්කම් 01
10. අඩි 06 උස වීදුරු සහිත ලී කණ්නාඩි මේස 01
11. චේවැල් සහිත ඇඳි ලී පුටු 04
12. 6 x 4 කණ්නාඩි සහිත වානේ අල්මාරි 02
13. 6 x 4 ලී අල්මාරි 01
14. 6 x 4 ලී අල්මාරි කණ්නාඩිය සහිත 01
15. අඩි 4 සිසිල් වර්ගයේ කොළ පැහැති ශීතකරණ 01

16. අඩි 3 1/2 දිග පැති ලාච්චු සහිත ලී මේස 01
17. නිල් පැහැති පරිඝණක පුටු 01
18. අඩි 5 x 3 වීදුරු සහිත ලී කබඩ් 01

කේ. ඒ. එල්. පී. කුමාරි,
නියෝජ්‍ය පිස්කල්/ප්‍රොබේට් නිලධාරි,
සාම විනිසුරු,
දිසා අධිකරණය, මහනුවර.

වර්ෂ 2025 ඔක්තෝබර් මස 01 දින දී ය.

11-269

---

# විවිධ දැන්වීම්

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද (වාණිජ) මහාධිකරණයේ දී ය

*නඩු අංකය* : CHC 57/2025/CO
*ස්වභාවය* : සමාගම්
*ක්‍රියා පටිපාටිය* : විශේෂ
*වටිනාකම* : රු. 250,000,000/-

2007 අංක 07 දරන සංශෝධිත සමාගම් පනතේ 270, 272, 273, 286 සහ 521 යන වගන්ති යටතේ වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

සෙයිඩ් අහමඩ් ෆාති මොහොමඩ්,
(Seyed Ahmed Fathhi Mohamed)
අංක 133/3,
පමුණුව පාර,
මහරගම.

*...........පෙත්සම්කරු.*

*එදිරිව*

1. එලිගනෝ ක්ලෝතිං (පීවීටී) එල්ටීඩී,
   Eliganno Clothing Private Limited,
   අංක 13/05,
   මෙල්ෆර්ඩ් ටවර්,
   හැව්ලොක් සිටි,
   කොළඹ 05.

2. ජයිනුල් අබ්දීඩ් මොහොමඩ් සහරාන්,
   Jainul Abdeed Mohamed Zaharan,
   අංක 114/7,
   වෝඩ් පෙදෙස,
   කොළඹ 7.

3. ද කෝපරේට් ලෙජන්ඩ් (පුද්ගලික) සමාගම,
   The Corporate Legend (Pvt.) Ltd.,
   අංක 23/1-1/1,
   අතපත්තු මාවත,
   දෙහිවල.

*.............වගඋත්තරකරුවන්.*

කොළඹ 05, හැව්ලොක් සිටි, මෙල්ෆර්ඩ් ටවර්, අංක 13/05 හි තම ලියාපදිංචි කාර්යාලය පිහිටි එලිගනෝ ක්ලෝතිං (පීවීටී) එල්ටීඩී (Eliganno Clothing Private Limited) (PV 00256429) සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා 2025 සැප්තැම්බර් මස 29 දින දරන පෙත්සමක් සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයට ඉදිරිපත් කොට ඇති බවත්, එකී පෙත්සම පිළිබඳ විමසීම වර්ෂ 2025 දෙසැම්බර් මස 01 දිනට නියම කර ඇති බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සම්බන්ධයෙන් පාක්ෂිකව හෝ විරුද්ධව කරුණු දැක්වීමට අදහස් කරන එම සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට තම අදහස වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ දී පෞද්ගලිකව හෝ ලේඛනගත නීතිඥවරයෙකු මගින් පෙනී සිට කරුණු දැක්විය හැකි බවත්, පෙත්සමේ පිටපතක් නියමිත ගාස්තු ගෙවීම මත එහි කවර හෝ ණයහිමියෙකු හෝ දායකයෙකුට පහත අත්සන් කරන නීතිඥතැනගෙන් ඉල්ලා සිටි විට ලබාගත හැකි බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

නීතිඥ සුහාෂිනී ජේ. පතිරණගේ මෙනවිය,
අංක 152/1/13, අලුත්කඩේ වීදිය, කොළඹ 12.

***සටහන.-*** මෙම පෙත්සම විමසීමට ගන්නා අවස්ථාවේ දී පෙනී සිටීමට බලාපොරොත්තුවන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ සුහාෂිනී ජේ. පතිරණගේ මෙනවිය වෙත ලිඛිතව දන්වා භාරදිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනුම්දීම කරන පුද්ගලයාගේ නම සහ ලිපිනය ද, සමාගමක් වේ නම් සමාගමේ නම සහ ලිපිනය ද, දැන්වීමේ සඳහන් කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥ විසින් අත්සන් කළ යුතු අතර 2025.11.30 දින පස්වරු 4.00 ට පෙර භාරදිය යුතුය. ලියාපදිංචි තැපැල් මගින් එවන්නේ නම් ඉහත සඳහන් නීතිඥතැනගේ ලිපිනයට ඉහත දිනට පෙර ලැබෙන ලෙසට ප්‍රමාණවත් කාලයක් සහිතව එවිය යුතුය.

සුහාෂිනී ජේ. පතිරණගේ,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ.

11-309

---

**පාර්ලිමේන්තුව**

මාස් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

එම්. ඒ. එම්. තාහිර් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "මාස් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි.

*(අ)* ස්වාභාවික ආපදාවයන්හි දී හා විපත් හා අනපේක්ෂිත අවස්ථාවල දී සහන සහ සුභසාධන සැලසීම ;
*(ආ)* අසරණ ජොෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් විවිධ උපකාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඔවුන් වෙනුවෙන් අවශ්‍ය ආධාර උපකාර කිරීම ;
*(ඇ)* අඩු ආදායම්ලාභී පවුල්වල දූ දරුවන් සඳහා අධ්‍යාපනික කටයුතු ඉහළ නැංවීම වෙනුවෙන් අවශ්‍ය අධ්‍යාපනික උපකරණ හා ආධාර ලබා දීම,

යනාදිය වේ.

එම්. ඒ. එම්. තාහිර්,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
දිගාමඩුල්ල දිස්ත්‍රික්කය.

11 - 294

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.